Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

# කාන්තා ශ්‍රම සහභාගිත්වය කෙරෙහි බලපාන සාධක (නිවිතිගල ප්‍රා.ලේ.කොඃ දොඹගම්මන ග්‍රාම නිලධාරි වසම ආශ්‍රයෙන්)

***ඩබ්. එම්. සී. එල්. කේ. විජේකෝන්*** [1]
***එම්. එම්. ගුණතිලක්*** [2]

**සංක්ෂේපය**

රටක ආර්ථික සංවර්ධනය වේගවත් කර ගැනීම සඳහා කාන්තා ශ්‍රම සහභාගිත්වය වැදගත් සාධකයක් වේ. ශ්‍රී ලංකාවේ පවත්නා සමාජ ආර්ථික තත්ත්වය අනුව කාන්තාවන් වැඩි වශයෙන් ශ්‍රමය සැපයීමට ඉදිරිපත් නොවේ. බොහෝ පර්යේෂකයන්ට අනුව අධ්‍යාපන මට්ටම, වයස, දරුවන් සංඛ්‍යාව, දරුවන්ගේ වයස හා ආර්ථික පසුබිම යන සාධක කාන්තා ශ්‍රම සහභාගිත්වය තීරණය කිරීමට බලපානු ලබන බව පෙනේ. ඒ අනුව ග්‍රාමීය සහ වතු කාන්තාවන් රැකියාවක නියුතු වීමට හෝ නොවීමට බලපාන හේතු පිළිබඳ විශ්ලේෂණය කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වේ.

නිවිතිගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් දොඹගම්මන ග්‍රාම නිලධාරී වසම මේ සඳහා තෝරාගත් අතර නියැදි රාමුව වූ එම ග්‍රාම නිලධාරී වසමේ ශ්‍රම බලකායට අයත් කාන්තාවන් අතරින් කාන්තාවන් 60 දෙනෙකු ක්‍රමවත් නියැදීම භාවිතයෙන් තෝරා ගන්නා ලදී. ප්‍රාථමික දත්ත ලබා ගැනීමේ දී ප්‍රශ්නාවලි ක්‍රමය සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමය යොදා ගත් අතර දත්ත විශ්ලේෂණයේ දී ප්‍රවර්ධන ප්‍රතිපායන ආකෘතිය (Logit model) භාවිත කරන ලදී.

මෙහි ප්‍රතිඵල අනුව වතු අංශයේ කාන්තාවන්ගේ ශ්‍රම සහභාගිත්වය ග්‍රාමීය කාන්තා ශ්‍රම සහභාගිත්වයට වඩා ඉහළ මට්ටමක පැවති අතර ඔවුන්ගේ ජීවන රටාව හා සම්බන්ධ තේ හෝ රබර් වගාව ආශ්‍රිත රැකියාවල නිරතවනු දක්නට ලැබිණ. ඇතැම් ස්ත්‍රීන් වතු වගාවේ පවත්නා දුෂ්කරතා හේතුවෙන් ඉන් ඉවත් වී කම්කරු රැකියාවල යෙදෙන මුත් ඔවුන්ට ලැබෙනා අඩු වැටුප් පවුලේ කටයුතු සඳහා ප්‍රමාණවත් නොවේ. ග්‍රාමීය කාන්තාවන්ගේ ශ්‍රම සහභාගිත්වය රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය මෙන් ම ව්‍යාපාරික හා ස්වයං රැකියා යන අංශ යටතේ ප්‍රධාන වශයෙන් බෙදී ගොස් තිබුණ ද කාන්තා ශ්‍රම සහභාගිත්වය අඩු මට්ටමක පැවතුණි. ඒ සඳහා ස්වාමිපුරුෂයාගේ රැකියාව පවුලේ කටයුතු සඳහා ප්‍රමාණවත් වීම, දරුවන්ගේ වයස් සීමාව බලපා ඇති බව නිගමනය කළ හැකිය. කාන්තා ශ්‍රම සහභාගිත්වයට වතු කාන්තාවන්ගේ අධ්‍යාපන මට්ටමේ බලපෑමක් දක්නට නොලැබෙන අතර ග්‍රාමීය කාන්තාවන්ගේ අධ්‍යාපන මට්ටම සේවා නියුක්ත වීමට බලපා ඇත. එහෙත් ද්විතීයික අධ්‍යාපනය පවා ලද ස්ත්‍රීන් රැකියා සඳහා යොමු නොවනු ද ග්‍රාමීය අංශය තුළ දත්නට ලැබුණි. සමස්ථයක් ලෙස මෙහිදී නිගමනය කළ හැක්කේ කාන්තාවක් රැකියාවක නිරතවීමට හෝ නොවීමට ඇයගේ සමාජ-ආර්ථික තත්ත්වය ප්‍රධාන වශයෙන් බලපෑම් කරන අතර ඊට අමතරව වයස, අධ්‍යාපන මට්ටම, දරුවන් සංඛ්‍යාව, දරුවන්ගේ වයස මෙන් ම ස්වාමිපුරුෂයාගේ රැකියා තත්ත්වය බලපෑමක් කරනු ලබන බවයි. ඒ අනුව ග්‍රාමීය කාන්තාවන්ගේ ශ්‍රමය ඵලදායීව රටේ ආර්ථික කටයුතු කෙරෙහි යොදා ගැනීම සඳහා කාන්තාවන් දැනුවත් කිරීමෙන් යම් සුදුසු රැකියා අවස්ථාවක් කරා යොමු කිරීම වැදගත් වේ.

මුඛ්‍ය පද -. කාන්තාව, ශ්‍රම සහභාගිත්වය, ග්‍රාමීය අංශය, වතු අංශය

1 *ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව;* universitykelani@gmail.com

2 ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය , *කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව;*